සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

7 ශ්‍රේණිය

# ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

### I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01- 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දේව මැවිල්ලේ ප්‍රධාන තැන හිමි වන්නේ,

(1) අහසටය. (2) පක්ෂීන්ටය.

(3) මිනිසාටය. (4) සූර්යාටය.

02. ජේසුස් වහන්සේ පාළුකරයේ ගත කළ දින ගණන වන්නේ දින,

(1) 3 කි. (2) 7 කි.

(3) 40 කි. (4) 60 කි.

03. "පෙර මඟ දූතයා" යන අනවර්ථ නාමයෙන් හඳුන්වන්නේ,

(1) ස්නාවක ජොහාන් තුමා ය. (2) ජාකොබ් තුමා ය.

(3) ජේසු තුමා ය. (4) පේදුරු තුමා ය.

04. තම පාද සෝදනවාට විරුද්ධ වූ ගෝලයා වන්නේ,

(1) පේදුරු ය. (2) ජුදාස් ය.

(3) ජාකොබ් ය. (4) තෝමස් ය.

05. 'වතුරෙන් ගොඩ ගත්' යන අර්ථය ඇති නම ලැබී තිබුනේ,

(1) මීරියම්ට ය. (2) මෝසෙස්ට ය.

(3) සාමුවෙල්ට ය. (4) ජොහාන්ට ය.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

(දෙවියන් වහන්සේ, පසුතැවිලි, දේව වචනය, යෙසායා, අඛණ්ඩ ව)

06. ජේසු තුමා පරීක්ෂාවන්ට මුහුණ දුන්නේ ........................................................................ තුළින් උත්තර දීමෙනි.

07. ස්නාවක ජොහාන් තුමාගේ අති විශේෂ මෙහෙය ගැන දිවැස්වැකි පැවසුවේ..................................................... දිවැසිවරයායා.

08. දේව සැලැස්මේ ක්‍රියාකාරීත්වය ........................................................................................ අදත් සිදු වේ.

09. පවුලේ නිර්මාතෘවරයා වන්නේ ................................................................................................................ ය.

10. අප නිරතුරුවම අපේ පව් ගැන .............................................................................................................. වෙමු.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරි නම් (✓) ලකුණද වැරදි නම් (x) ලකුණද යොදන්න.**

11. ස්නාවක ජොහාන් තුමා ආහාරයට ගත්තේ රොටී සහ වනමීය. (...........)

12. ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් සඳහා යොදා ගත්තේ ස්වාවික ස්ථානයන්ය. (...........)

13. ජේසු තුමාට පැමිණි පරීක්ෂා ගණන තුනකි. (...........)

14. දේව මැවිල්ල විනාශ කිරීම අපේ වගකීමකි. (...........)

15. 'පියාණෙනි මේ කුසලාන පහ කළ නොහැකි නම් ඔබගේ කැමැත්ත වේවා'යි පැවසුවේ ජේසු තුමාය. (...........)

- **අංක 16 - 20 තෙක් ප්‍රශ්නවලට A කොටසේ වගන්ති හා ගැලපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. 'පොළොං වංශය' කියා ආමන්ත්‍රණය කළේ | දූවිල්ලෙනි. |
| 17. දේව ගරු බිය පෑම යනු | දෙවියන් වහන්සේ ය. |
| 18. දෙවියන් වහන්සේ මිනිසා නිර්මාණය කළේ | කාන්තාවන්ය. |
| 19. අප හැම කෙනෙකුටම ජීවය ලබා දෙන්නේ | පරිසිවරුන්ටය. |
| 20. ධර්මශාලා වලට යෑමට අවසර නොලැබූ කොටසක් වන්නේ | ප්‍රඥාවේ උල්පතයි. |

(ල. 2x20 = 40)

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (1) ස්නාවක ජොහාන් තුමාගේ මව සහ පියා නම් කරන්න.
(2) අද සමාජය තුළ දරුවන්ට එල්ල වන පීඩා 02 ක් ලියන්න.
(3) ළමා සුරක්ෂිතභාවය වෙනුවෙන් කැප වූ ආයතන 02 ක් නම් කරන්න.
(4) දේව නිර්මාණයේ අඛණ්ඩ පැවැත්මට උදාහරණ 02 ක් ලියන්න.
(5) පවුලක් තුළ තිබිය යුතු කිතුණු ගුණාංග 02 ක් ලියන්න.
(6) ස්නාවක ජොහාන් තුමාගේ ආහාර හා ඇඳුම් පැළඳුම් නම් කරන්න.
(7) 'ඔබ ලෝකයේ ආලෝකය' නම් සමාජය තුළ ආලෝකයක් වීමට ඔබට කළ හැකි දේවල් 02 ක් ලියන්න.
(8) ජේසු තුමා තම ඉගැන්වීම් සඳහා යොදා ගත් ස්ථාන 02 ක් ලියන්න. (ල. 2x8 = 16)

02. (1) දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට භාර දී ලබා දුන් වගකීම් 02 ක් ලියන්න. (ල. 02)
(2) මිනිසා දේව මැවිල්ල විනාශ කරන ආකාර 03 ක් ලියන්න. (ල. 03)
(3) දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ඔබට කළ හැකි දේවල් 06 ක් ලියන්න. (ල. 06)

03. (1) දෙවියන්ගේ ස්ථිර ප්‍රේමය මගින් අපට ලැබෙන වරප්‍රසාද 02 ක් ලියන්න. (ල. 02)
(2) දේව ගරු බිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 03)
(3) ඔබ දේව ප්‍රේමය තුළින් කටයුතු කළ අවස්ථාවක් ලියන්න. (ල. 06)

04. (1) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා ගණන කීයද? (ල. 02)
(2) එම පරීක්ෂා නම් කරන්න. (ල. 03)
(3) කිතුනු දරුවෙකු ලෙස ඔබ මුහුණ දෙන පරීක්ෂාවන් 03 ක් නම් කර ඔබ ඒවායින් ජයගන්නා ආකාරය ලියන්න. (ල. 06)

05. (1) ජේසුස් වහන්සේගේ ජීවිතය පූජාවට පෙර ඊට ආසන්නව සිදු වූ සිදුවීම් 02 ක් ලියන්න. (ල. 02)
(2) එම සිදුවීම් වලින් ඔබ වඩාත් කැමති සිදුවීමක් පිළිබඳ කරුණු 03 ක් ලියන්න. (ල. 03)
(3) දුක් ප්‍රාප්තියට පෙර සිදු වූ මෙම සිදුවීම් තුළින් ඔබ ජීවිතයට ලබාගත් ආදර්ශ 03 ක් ලියන්න. (ල. 06)

06. (1) බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් 02 ක නම් කරන්න. (ල. 02)
(2) පංච පුස්තකයට අයත් පොත් 03 ක් නම් කරන්න. (ල. 03)
(3) බයිබල් කියවීම තුළින් ඔබ ඔබේ ජීවිතයට ලබා ගත හැකි දේවල් 03 ක් ලියන්න. (ල. 06)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01. ( 3 )  02. ( 3 )  03. ( 1 )  04. ( 1 )  05. ( 2 )

06. දේව වචනය  07. යෙසායා  08. අඛණ්ඩව  09. දෙවියන් වහන්සේ  10. පසුතැවිලි

11. ( x )  12. (✓)  13. (✓)  14. ( x )  15. (✓)  16. පරිසිවරුන්ටය.  17. ප්‍රඥාවේ උල්පතයි

18. දූවිල්ලෙනි.  19. දෙවියන් වහන්සේ  20. කාන්තාවන් ය.

## II කොටස

01. (1) මව - එලිසබෙත්  පියා - සෙකරියස්

(2) ★ මව පියා විදේශ ගත වීම.  ★ විවිධ අපරාධ වලට සම්බන්ධ වීම.
★ යුද්ධය හා ස්වභාවික විපත් නිසා අසරණ වීම.  ★ විවිධ හිංසනවලට ගොදුරු වීම.
★ දුප්පත්කම / ළමා මෙහෙකාර කමේ යෙදීම.

(3) ★ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය  ★ රාජ්‍ය නොවන ස්වෙච්ඡා සංවිධාන
★ එක්සත් ජාතීන්ගේ ළමා රක්ෂණ අරමුදල  ★ පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව

(4) වැස්ස ඇතිවීම / දිවා රෑ ඇති වීම / නව දරු උපත් / බිත්තරයකින් නව ජීවයක්.

(5) ආදරය / රැකවරණය / පරිත්‍යාගය / ධෛර්යමත් කිරීම / සමාව දීම - ලැබීම.

(6) ආහාර - පළගැටියන් හා වන මී
ඇඳුම් - ඔටුලෝම වස්ත්‍රයක් / ඉනට සම් පටියක්.

(7) ★ පරිත්‍යාගශීලීව කටයුතු කිරීම.  ★ සමාව දීම.
★ බෙදා ගැනීම.  ★ ප්‍රේමයෙන් /කරුණාවෙන් කටයුතු කිරීම.

(8) කඳු මුදුන් / මිරියාවත් / මුහුදු වෙරළ  (ල. 2x8=16)

02. (1) ★ දරු සම්පත් ලැබීම.  ★ පොළව පුරා පැතිර එය පාලනය
★ මැවිල්ලෙන් නිසි ප්‍රයෝජන ගැනීම.  ★ සතුන් ආරක්ෂා කිරීම, පාලනය.
★ භූමිය රැකගෙන එය වගා කිරීම.

(2) ගස් කැපීම / වායු දූෂණය / පරිසර දූෂණය / ජලය අපවිත්‍ර කිරීම / අනවසර ඉදි කිරීම්.

(3) ★ නිවස අවට පරිසරය සුරැකීම.  ★ සම්පත් අරපිරිමැස්මෙන් භාවිත කිරීම.
★ ගස් කොළන් සතුන් ආරක්ෂා කර ගැනීම.  ★ පරිසරය සුරැකීමේ සංවිධාන වලට දායක වීම.
★ පොලිතින්, ප්ලාස්ටික් භාවිතයෙන් තොර වීම.  ★ ශ්‍රමදාන වලට දායක වීම.

03. (1) ★ නිරෝගී ජීවිතයක්  ★ දේව ගරු බිය ඇති ජීවිතයක්
★ පාපයෙන් මුදන ජීවිතයක්.  ★ යුක්තිගරුක සාධාරණ ජීවිතයක්.
★ ප්‍රේමයේ / දයාවේ ජීවිතයක්

(2) ★ දේව පනත් වලට කීකරු වීම.  ★ සෑම විටම යහපතට මුල්තැන දෙමින් ක්‍රියා කිරීම.
★ ඉරුදින දේව මෙහෙයට සහභාගි වීම.  ★ දේව වචනය පිළිපැදීම.
★ යාච්ඤාවේ ජීවිතයක් ගත කිරීම.

(3) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

04. (1) තුනයි

(2) 1. මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් කරන්න.

2. සියලු රට රාජ්‍යයන් පෙන්වා ඒවා කෙරේ ආධිපත්‍ය ඒවායේ යස ඉසුරු ලබා දීමට නම් යක්ෂයාට නමස්කාර කරන්න.

3. ජෙරුසලමේ කොත මුදුනට ගෙන ගොස් එතැනින් පහළට පනින්න.

(3) සොරකම් වලට සම්බන්ධ වීම, මත්ද්‍රව්‍යයට ඇබ්බැයි වීම, පරිගණකය වැනි දේට වහල්වීම, අසැබි වීඩියෝ දර්ශන නැරඹීම, පන්ති කට් කිරීම.

මුහුණ දෙන ආකාරය :- දේව වචනය තුළ ජීවිතය ගොඩනගා ගැනීම පරීක්ෂාවන් ප්‍රතික්ෂේප කිරීම, ධෛර්ය සම්පන්නව කටයුතු කිරීම, අපගේ දුර්වලකම් තේරුම් ගනිමින් යක්ෂයා පරාජය කිරීම.

05. (1) අන්තිම රාත්‍රී භෝජනය / ශ්‍රාවකයන්ගේ පාද සේදීම / ගෙත්සෙමනේ යාච්ඤාව

(2) අන්තිම රාත්‍රී භෝජනය :-

★ රොටී රැගෙන ආශිර්වාද කර ගෝලයන්ට දීම.

★ කුසලාන ගෙන තුති පුදා ගෝලයන්ට දීම.

★ රොටී සහ කුසලාන කරණකොට ගෙන අපි ජේසුස් වහන්සේගේ ශරීරයේ පංගුකරුවන් වන බව.

ශ්‍රාවකයන්ගේ පාද සේදීම :-

★ දිය බඳුනක් ගෙන ජේසු තුමා ශ්‍රාවකයන්ගේ පාද සේදීම.

★ ඉණ බැඳි තුවායෙන් පිස දැමීම.

★ තම පාද සේදීම පේදුරු ප්‍රතික්ෂේප කිරීම.

ගෙත්සෙමනේ යාච්ඤාව :-

★ පේදුරු, ජාකොබ්, ජොහාන් සමඟ කන්දට යාම.

★ ජේසු තුමා යාච්ඤා කිරීම.

★ ශ්‍රාවකයන් වෙත ගොස් පරීක්ෂාවට නොවැටෙන ලෙස අවදිව යාච්ඤා කරන්නැයි කීම.

(3) ★ පාප වලට නිසි ලෙස පසුතැවීම.

★ යම් ක්‍රියාවකට සූදානමින් මුහුණ දීම.

★ යාච්ඤාවට මුල්තැන දීම.

★ කීකරු වීම.

★ දේව කැමැත්තට අවනත වීම.

06. (1) නව ගිවිසුම / පැරණි ගිවිසුම

(2) උත්පත්ති / නික්මයාම / ද්විතීයික නීති සංග්‍රහය / ගණන් කථාව / ලෙවී කතාව

(3) ලියා ඇති පිළිතුරට අනුව ලකුණු ලබා දෙන්න.